*සැ. යු.* — මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටස යටතේ 2012 වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා වූ කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,875- 2014 අගෝස්තු මස 08 වැනි සිකුරාදා - 2014.08.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 1118 |

*සැ. යු.* - සත්මෙත්සිත්හවුල සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2014 ජූලි මස 18 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 අගෝස්තු මස 29 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 අගෝස්තු මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1117 - B 80863 — 300 (2014/08)
D 1 -

# විවිධ දැන්වීම්

## උස්මානියියාහ් අරාබි විදුහල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

එම්. එස්. තවුෆීක් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 48 (1) යටතේ "උස්මානියියාහ් අරාබි විදුහල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථ වලින් යුක්ත වන්නා වූ එකී විදුහල සංස්ථාගත කිරීමයි.

(1) ඉස්ලාමීය "ෂරියා" නීතිය යටතේ සමාජයට මඟපෙන්වීමට සමත් ඉස්ලාමීය දේවධර්මවාදීන් බිහි කිරීම,
(2) ඉස්ලාමීය ධර්මය ආරක්ෂා කිරීම,
(3) ජාතීන් අතර සාමය වර්ධනය කිරීමට,

යනාදිය වේ.

එම්. එස්. තවුෆීක්,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය.

08-460

---

## ශ්‍රී ලංකා ළමා සංවර්ධන සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

වෛද්‍ය සුදර්ශිනි ප්‍රනාන්දුපුල්ලේ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 48 (1) යටතේ "ශ්‍රී ලංකා ළමා සංවර්ධන සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ශ්‍රී ලංකා ළමා සංවර්ධන සංගමය සංස්ථාගත කිරීමයි.

සංගමයේ අරමුණු :

(1) ළමා සංවර්ධනය පිළිබඳ වෘත්තිමය දැනුම සහ නිපුණතා දියුණු කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම සහ ආධාර කිරීම,
(2) ළමා සංවර්ධනය සහ වර්ධන රෝග පිළිබඳ පර්යේෂණ කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම සහ ආධාර කිරීම,
(3) ළමා සංවර්ධනය සහ වර්ධන රෝග ඇති ළමුන්ගේ අභිවෘද්ධිය සඳහා ක්‍රියා කිරීම,
(4) වර්ධන රෝග ඇති ළමුන්ගේ සහ පොදුවේ ළමුන් සහ ඔවුන්ගේ පවුල්වල ජීවිතයේ ගුණාත්මක බව දියුණු කිරීම සඳහා ක්‍රියා කිරීම සහ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීම,

යනාදිය වේ.

වෛද්‍ය සුදර්ශිනි ප්‍රනාන්දුපුල්ලේ,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
ගම්පහ දිස්ත්‍රික්කය.

08-413

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.